# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අති විශෙෂ**

**අංක 2456/27 – 2025 සැප්තැම්බර් මස 30 වැනි අඟහරුවාදා – 2025.09.30**

**(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)**


# IV (අ) වැනි කොටස – පළාත් සභා

## පළාත් සභා නිවේදන

### අම්බලන්ගොඩ නගර සභාව

විනෝද බද්ද

(267 වන අධිකාරය වන) විනෝද බදු ආඥා පනතේ දෙවන වගන්තියේ (1) වන උප වගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාරව ගාල්ල දිස්ත්‍රික්කයේ අම්බලන්ගොඩ නගර සභාව විසින් 2025 ජූලි 01 වැනි දින පවත්වන ලද සභා රැස්වීමේ තීරණ අංක 05.01.01.01 යටතේ සම්මත කරන ලද පහත යෝජනාව 1989 අංක 12 දරන පළාත් සභා (ආනුශාංගික විධිවිධාන) පනතේ දෙවන වගන්තියේ (1) වන උප වගන්තියේ (අ) ඡේදය සමග කියවිය යුතු විනෝද බදු ආඥා පනතේ දෙවන වගන්තියේ (2) වන උප වගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාරව දකුණු පළාතේ ආණ්ඩුකාරවර මද්දුම කංකානමලාගේ බන්දුල හරිස්චන්ද්‍ර වන මා විසින් අනුමත කරන ලද බව මෙයින් කාරුණිකව නිවේදනය කරනු ලැබේ.

**මද්දුම කංකානමලාගේ බන්දුල හරිස්චන්ද්‍ර,**
ආණ්ඩුකාරවර,
දකුණු පළාත.

2025 ක් වූ සැප්තැම්බර් මස 25 වැනි දින,
දකුණු පළාතේ ආණ්ඩුකාරවර කාර්යාලයේ දී ය.


1A – PG7266– 07 (2025/09)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

**යෝජනාව**

267 වන අධිකාරය වන විනෝද බදු ආඥා පනතේ දෙවන වගන්තියේ (1) වන උප වගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාරව අම්බලන්ගොඩ නගර සභාව, සභාවේ පරිපාලන සීමා ඇතුළත වූ ප්‍රදේශයෙහි පවත්වනු ලබන එකී ආඥා පනතේ විස්තර කර ඇති යම් යම් විනෝද කටයුත්තකට කරනු ලබන ගෙවීමකින්, සිනමා ශාලා සඳහා 10% ක් ද, අනෙකුත් සියලුම විනෝද කටයුතු සඳහා ප්‍රවේශ පත්‍ර වටිනාකමින් 12.5% කට සමාන මුදලක් බද්ද වශයෙන් පනවා අය කළ යුතු යැයි ද, මෙම යෝජනාව 2025.10.01 දින සිට ක්‍රියාත්මක විය යුතු යැයි ද, යෝජනා කරන්නීය. එසේම ඉහත පනවන ලද විනෝද බද්ද එකී විනෝද කාර්යය පවත්වන දිනට පෙර අදාළ සංවිධායක හෝ සංවිධායකවරුන් විසින් නිසි ලෙස අම්බලන්ගොඩ නගර සභාවට ගෙවිය යුතු බවටත්, අම්බලන්ගොඩ නගර සභාව වැඩිදුරටත් යෝජනා කරන්නීය.

EOG 09 – 0271

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.